# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,123 - 2019 මැයි මස 10 වැනි සිකුරාදා - 2019.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 972 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 974 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 31 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

971 - B 81522— 5,403 -2019/05)
F 1 -

# පළාත් සභා නිවේදන

## කොලොන්න ප්‍රාදේශීය සභාව

### පොදු සුසාන භූමි ලෙස භාවිතා කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සුසාන භූමි හා මිනීපිටි ආඥා පනතේ 03 වන වගන්තිය යටතේ නිසි බලධාරියා වන කොලොන්න ප්‍රාදේශීය සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 02 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 5 වන වගන්තියෙන්, ගරු විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල සබරගමුව පළාත් සභාව විසුරුවා හැරීමත් සමඟ ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරීමෙන් පසු එම බලතල ප්‍රකාරව මෙහි පහත අංක 01 සිට 10 දක්වා උපලේඛනවල විස්තර කර ඇති ඉඩම් මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට නියම කරමි.

ධම්ම දිසානායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2019 පෙබරවාරි මස 24 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

#### 01 උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ඉඩමේ නම | - | තලගහවත්ත හඳුවහේන සුසාන භූමිය | | |
| (ii) | ග්‍රාම නිලධාරී වසම | - | 202A, රංහොටිකන්ද | | |
| (iii) | ඉඩමේ ප්‍රමාණය | - | හෙක්. 0.1971 | | |
| (iv) | ඉඩමේ විස්තරය | - | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN 2013/760 දක්වා ඇති කැබලි අංක 310 | | |
| (v) | මායිම් උපලේඛනය | - | *උතුරට* | - | කැබලි අංක 247, 307 |
| | | | *නැගෙනහිරට* | - | කැබලි අංක 308 |
| | | | *දකුණට* | - | කැබලි අංක 311 |
| | | | *බටහිරට* | - | කැබලි අංක 311, 247. |

#### 02 උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ඉඩමේ නම | - | මොරගොඩ රුක්හේන සුසාන භූමිය | | |
| (ii) | ග්‍රාම නිලධාරී වසම | - | 203, විජේරිය | | |
| (iii) | ඉඩමේ ප්‍රමාණය | - | හෙක්. 0.4249 | | |
| (iv) | ඉඩමේ විස්තරය | - | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN 2013/759 දක්වා ඇති කැබලි අංක 26 | | |
| (v) | මායිම් උපලේඛනය | - | *උතුරට* | - | කැබලි අංක 112, 113 |
| | | | *නැගෙනහිරට* | - | කැබලි අංක 112 |
| | | | *දකුණට* | - | කැබලි අංක 112, 114 |
| | | | *බටහිරට* | - | කබැලි අංක, 27, 114. |

#### 03 උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ඉඩමේ නම | - | වැලැනෙවත්ත කොස්රුප්පහේන සුසාන භූමිය | | |
| (ii) | ග්‍රාම නිලධාරී වසම | - | 208 C හේනැග්ගොඩ | | |
| (iii) | ඉඩමේ ප්‍රමාණය | - | හෙක්. 0.2807 | | |
| (iv) | ඉඩමේ විස්තරය | - | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN 2013/649 හි දක්වා ඇති කැබලි අංක 14 | | |
| (v) | මායිම් උපලේඛනය | - | *උතුරට* | - | කැබලි අංක 13 |
| | | | *නැගෙනහිරට* | - | කැබලි අංක 11 |
| | | | *දකුණට* | - | කැබලි අංක 108 හා මාර්ගය |
| | | | *බටහිරට* | - | මාර්ගය හා කැබලි අංක 12. |

### 04 උපලේඛනය

(i) ඉඩමේ නම - මඩුවන්වෙල මායිම් දඹේහේන සුසාන භූමිය
(ii) ග්‍රාම නිලධාරී වසම - 205 B මඩුවන්වෙල පැරණිගම
(iii) ඉඩමේ ප්‍රමාණය - හෙක්. 0.1416
(iv) ඉඩමේ විස්තරය - මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/2013/495 සහ 643 හි දක්වා ඇති කැබලි අංක 216
(v) මායිම් උපලේඛනය - *උතුරට* - කැබලි අංක 215
*නැගෙනහිරට* - කැබලි අංක 215 සහ 181
*දකුණට* - කැබලි අංක 181 සහ 217
*බටහිරට* - කැබලි අංක 217 සහ 215.

### 05 උපලේඛනය

(i) ඉඩමේ නම - යක්මඩිත්ත මීනුහේන සුසාන භූමිය
(ii) ග්‍රාම නිලධාරී වසම - 204 A යක්මඩිත්ත
(iii) ඉඩමේ ප්‍රමාණය - හෙක්. 0.2447
(iv) ඉඩමේ විස්තරය - මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/ 2013/641 හි දක්වා ඇති කැබලි අංක 77
(v) මායිම් උපලේඛනය - *උතුරට* - කැබලි අංක 83, 147
*නැගෙනහිරට* - කැබලි අංක 148 සහ 154
*දකුණට* - කැබලි අංක 155
*බටහිරට* - කැබලි අංක 79.

### 06 උපලේඛනය

(i) ඉඩමේ නම - කපුකන්ද ගම කඩිගල්ලහේන සුසාන භූමිය
(ii) ග්‍රාම නිලධාරී වසම - 205 A - බුත්කන්ද
(iii) ඉඩමේ ප්‍රමාණය - හෙක්. 0.1973
(iv) ඉඩමේ විස්තරය - මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN 2014/19 හි දක්වා ඇති කැබලි අංක 68
(v) මායිම් උපලේඛනය - *උතුරට* - කැබලි අංක 61, 66
*නැගෙනහිරට* - කැබලි අංක 138
*දකුණට* - මාර්ගය
*බටහිරට* - කැබලි අංක 138.

### 07 උපලේඛනය

(i) ඉඩමේ නම - නැදොලකන්ද, කැරකෝප්පුව සුසාන භූමිය
(ii) ග්‍රාම නිලධාරී වසම - 205 A- බුත්කන්ද
(iii) ඉඩමේ ප්‍රමාණය - හෙක්. 0.4233
(iv) ඉඩමේ විස්තරය - මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/2013/645 හි දක්වා ඇති කැබලි අංක 206
(v) මායිම් උපලේඛනය - *උතුරට* - කැබලි අංක 204
*නැගෙනහිරට* - කැබලි අංක 205, 208
*දකුණට* - කැබලි අංක 196, 207
*බටහිරට* - කැබලි අංක 200, 197.

### 08 උපලේඛනය

(i) ඉඩමේ නම - බොරළුවගෙඅයින ජම්බුගහ කුඹුරගොඩ සුසාන භූමිය
(ii) ග්‍රාම නිලධාරී වසම - 206 A බොරළුවගෙඅයින
(iii) ඉඩමේ ප්‍රමාණය - හෙක්. 0.1340
(iv) ඉඩමේ විස්තරය - මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/2013/646 හි දක්වා ඇති කැබලි අංක 95
(v) මායිම් උපලේඛනය - *උතුරට* - කැබලි අංක 111 සහ 94
*නැගෙනහිරට* - කැබලි අංක 217
*දකුණට* - කැබලි අංක 217 සහ 111
*බටහිරට* - කැබලි අංක 111 සහ 94.

**09 උපලේඛනය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ඉඩමේ නම | - | කුඹුරුගමුව මහහේන්යාය සුසාන භූමිය | | |
| (ii) | ග්‍රාම නිලධාරී වසම | - | 208 කුඹුරුගමුව | | |
| (iii) | ඉඩමේ ප්‍රමාණය | - | හෙක්. 0.1492 | | |
| (iv) | ඉඩමේ විස්තරය | - | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/2014/18 හි දක්වා ඇති කැබලි අංක 07 | | |
| (v) | මායිම් උපලේඛනය | - | *උතුරට* | - | කැබලි අංක 139 |
| | | | *නැගෙනහිරට* | - | කැබලි අංක 139 |
| | | | *දකුණට* | - | කැබලි අංක 139 |
| | | | *බටහිරට* | - | කැබලි අංක 139. |

**10 උපලේඛනය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ඉඩමේ නම | - | හල්වින්න තැන්නගොඩ මල් ගොරකගහහේන සුසාන භූමිය | | |
| (ii) | ග්‍රාම නිලධාරී වසම | - | 208 කුඹුරුගමුව | | |
| (iii) | ඉඩමේ ප්‍රමාණය | - | හෙක්. 0.3313 | | |
| (iv) | ඉඩමේ විස්තරය | - | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක R/KLN/2013/648 හි දක්වා ඇති කැබලි අංක 24 | | |
| (v) | මායිම් උපලේඛනය | - | *උතුරට* | - | මාර්ගය |
| | | | *නැගෙනහිරට* | - | මාර්ගය සහ කැබලි අංක 165 |
| | | | *දකුණට* | - | කැබලි අංක 382 |
| | | | *බටහිරට* | - | කැබලි අංක 95, 382. |

05-165

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

### වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ **I** (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාලව 2018.12.14 දින අංක 2,102 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 12-522/5 නිවේදනයේ පහත සඳහන් ඡේද සශෝධනය කරනු ලැබේ.

*ඡේදය 7.4 සම්මුඛ පරීක්ෂණය :-*

මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*(අ)* පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබාදීම. **(උපරිම ලකුණු 10)**

| | | |
|---|---|---|
| I පන්තිය | - | ලකුණු 10 |
| II පන්තිය ඉහළ පෙළ | - | ලකුණු 07 |
| II පන්තිය පහළ පෙළ | - | ලකුණු 05 |

*(ආ)* ලබා දී ඇති උපාධිය වලංගු වන වර්ෂය අනුව ලකුණු ලබා දීම. **(උපරිම ලකුණු 12)**

| *උපාධිය වලංගු වන වර්ෂය* | *ලකුණු* |
|---|---|
| 2013 වර්ෂයේ හා ඊට පෙර ලබාගත් උපාධි සඳහා | 12 |
| 2014 වර්ෂය තුළ ලබාගත් උපාධි සඳහා | 08 |
| 2015 වර්ෂය තුළ ලබාගත් උපාධි සඳහා | 06 |
| 2016 වර්ෂය තුළ ලබාගත් උපාධි සඳහා | 04 |
| 2017 වර්ෂය තුළ ලබාගත් උපාධි සඳහා | 02 |
| 2018 වර්ෂය තුළ ලබාගත් උපාධි සඳහා | - |

*(ඇ)* අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම. **(උපරිම ලකුණු 10)**

| *අනු අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | **05** |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික 01 ක් හෝ කිහිපයක් ලබා තිබීම. | **05** |
| | මුළු ලකුණු | **10** |

*(ඈ)* දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලෙස හඳුනාගෙන ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ස්ථිර පදිංචිය අවම වසර 03ක කාලයක් සනාථ වන්නේනම් ඒ සඳහා ලකුණු 05ක් ලබා දිය යුතුය. **(උපරිම ලකුණු 05)**

| *කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස* | *පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස* |
|---|---|
| නිකවැරටිය | පුත්තලම |
| රස්නායකපුර | කල්පිටිය |
| කොටවෙහෙර | ආණමඩුව |
| පොල්පිතිගම | කරුවලගස්වැව |
| ඇහැටුවැව | මහකුඹුක්කඩවල |
| ගල්ගමුව | මුන්දලම |
| අඹන්පොල | නවගත්තේගම |
| ගිරිබාව | පල්ලම |
| මහව | වනාතවිල්ලුව |
| | ආරච්චිකට්ටුව |

02. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන *ගැසට් අංක* 2102 හා 2018.12.14 දිනැති 12-522/5 නිවේදනයේ සඳහන් අනෙකුත් විධි විධාන එලෙසින්ම බලපැවැත්වේ.

වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 මැයි මස 02 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

05-431

## මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කාර්මික III තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පවතින වඩු කාර්මික තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

1. *පොදු කොන්දේසි* - විවෘත බඳවා ගැනීම් සඳහා,

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
1.2 අයදුම්කරු මධ්‍යම පළාතේ පදිංචිකරුවෙකු විය යුතුය.
1.3 විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනය වන 2019.05.31 දිනට පූර්වාසන්න අවුරුදු පහක් (5) ක් ඇතුළත මධ්‍යම පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (3) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙක් විය යුතුය.
1.4 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
1.5 තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ සියලුම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අයැදුම්පත් කැඳවන 2019.05.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

2. *වයස් සීමාව :*

| *ධාරාව* | *වයස් සීමාව* |
|---|---|
| විවෘත | 2019.05.31 දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. (රජයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |

3. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

| *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් හයක් (6) සමත්වී තිබීම. | වඩු කාර්මික තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිගමනය කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) අවම වශයෙන් 02 වන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම. |

4. *පළපුරුද්ද :*

වඩු කර්මාන්තය සම්බන්ධව අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය.

5. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ප්‍රායෝගික (වෘත්තීය) පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ප්‍රායෝගික පරීක්ෂණය සමත් අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත්වූ අයදුම්කරුවන්ගේ පරීක්ෂණ දෙකෙහි මුළු ලකුණුවල එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

6.1 *ප්‍රායෝගික පරීක්ෂණය :*

| *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පුද්ගල ආකල්ප | 20 | 40 |
| යාන්ත්‍රික ක්‍රියාවලිය | 30 | |
| මූලික වැද්දුම් උපයෝගී කර ගැනීම | 50 | |
| එකතුව | 100 | 40 |

6.2 *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | 40 |
| 2. | අතිරේක පළපුරුද්ද | 40 | |
| 3. | අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 4. | තනතුරට අදාළ න්‍යායාත්මක දැනුම | 10 | |
| 5. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | | 100 | 40 |

07. *තනතුරට හිමි වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි PL 2- 2016 වන වැටුප් පරිමාණය.
රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 ක් වේ. 2019.01.01 දිනට වැටුප රු. 22,642 කි.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය. තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි හා අනෙකුත් කරුණු තීරණය වේ.

09. *අයැදුම් කිරීමේ ක්‍රමය :*

1.1 මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක (සෙ. මී. 21 x 29) දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 1-5 දක්වා ඡේදයන් පළමු වන පිටුවට ද, අංක 6 දෙවන පිටුවට ද අංක 7 සිට 9 තෙක් තුන්වන පිටුවට ද වශයෙන් ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2019.05.31** දිනට පෙර **''ලේකම්, මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය, තැ. පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **''මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කාර්මික - III තනතුර සඳහා බඳවා ගැනීම 2019''** යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම සේවා ප්‍රධානියා මඟින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

1.2 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම් ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

ආදර්ශ අයදුම්පත්‍රය මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශයේ, පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තු කාර්යාලයේ සහ පළාතේ පේෂකර්ම මධ්‍යස්ථානවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇත.

ඩබ්. එම්. කේ. කේ. කරුණාරත්න,
ලේකම්.

මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය,
තැ. පෙ. 41, ගැටඹේ,
පේරාදෙණිය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

*ආදර්ශ අයදුම්පත්‍රය*

**මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කාර්මික - III තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019**

1. *(අ)* මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. : PERERA A. B.)

*(ආ)* සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........

*(ඇ)* සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........

*(ඈ)* ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

*(ඉ)* දුරකථන අංකය : රාජකාරි : ☐☐☐☐☐☐☐☐☐☐

පෞද්ගලික : ☐☐☐☐☐☐☐☐☐☐

2. *(අ)* ස්ථිර ලිපිනය (සිංහලෙන්) :..........

..........

*(ආ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

මහනුවර : ☐ මාතලේ : ☐ නුවරඑළිය : ☐

*(ඇ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2019.05.31 දිනට මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය :

අවු. : ☐ මාස : ☐ දින : ☐

3. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

4. විභාගයට පෙනී සිටින මාධ්‍ය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

5. උපන් දිනය :

වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.05.31 දිනට වයස ඃ අවු. ඃ................ මාස ඃ............... දින ඃ.............

6. (6.1) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඃ (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 වන ඡේදය අනුව)

*අ.පො.ස. (සා. පෙළ) විභාගය ඃ*

වර්ෂය ඃ................................ විභාග අංකය ඃ................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | ................................................................. | ................................................................. |
| 2. | ................................................................. | ................................................................. |
| 3. | ................................................................. | ................................................................. |
| 4. | ................................................................. | ................................................................. |
| 5. | ................................................................. | ................................................................. |
| 6. | ................................................................. | ................................................................. |
| 7. | ................................................................. | ................................................................. |
| 8. | ................................................................. | ................................................................. |

*අ.පො.ස. (උ. පෙළ) විභාගය ඃ*

වර්ෂය ඃ................................ විභාග අංකය ඃ................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | ................................................................. | ................................................................. |
| 2. | ................................................................. | ................................................................. |
| 3. | ................................................................. | ................................................................. |
| 4. | ................................................................. | ................................................................. |
| 5. | ................................................................. | ................................................................. |

(6.2) වෘත්තීය සුදුසුකම් ඃ (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 03 ඡේදය අනුව)

6.2.1 පුහුණු පාඨමාලාවේ නම ඃ..................................................................................................................................

පුහුණු පාඨමාලාවේ කාලසීමාව .............................. සිට ................................ දක්වා

ආයතනය ඃ................................................................ සහතිකය වලංගු වන දිනය ඃ..........................................

6.2.2 *පළපුරුද්ද පිළිබඳ විස්තර ඃ*

ආයතනය ඃ..................................................................................................................................................

කාලසීමාව .............................. සිට ................................ දක්වා

7. ............................................................................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කාර්මික III තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ..................................

8. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ............................................................................................ මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .......................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :..................................................................................................................................
අත්සන :..................................................................................................................................................
තනතුර හා නිල නාමය :...............................................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙක්/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුද හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 4,52,916 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

9. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (අනවශ්‍ය වචන කපා හරින්න.)

............................................................................................................ මයා./මිය./මෙනවිය දැනට ........................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...................................................................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා හෝ සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්යය වශයෙන් විශ්‍රාම ගන්වා හෝ ඇති/නැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

.................................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :................................

05-305/1

---

## මධ්‍යම පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්ම උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2019

මධ්‍යම පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ඇති පේෂකර්ම මධ්‍යස්ථානවල පවතින පේෂකර්ම උපදේශක පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු කොන්දේසි* - විවෘත බඳවා ගැනීම සඳහා -

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
1.2 අයදුම්කරු මධ්‍යම පළාතේ පදිංචිකරුවෙකු විය යුතුය.
1.3 විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වාසන්න අවුරුදු පහක් (05) ඇතුළත මධ්‍යම පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් වත් (3) අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙක් විය යුතුය.
1.4 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
1.5 තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ සියලුම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අයදුම්පත් කැඳවන 2019.05.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

2. *පොදු කොන්දේසි* - සීමිත බඳවා ගැනීම සඳහා :-

2.1 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
2.2 අයදුම්කරුවන් රාජ්‍ය සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය. (දැනට පේෂකර්ම මධ්‍යස්ථානවල සේවය කරන කාර්මික/කාර්මිකාවන් සඳහා මෙය අදාළ නොවේ.)
2.3 නියමිත පූර්වාසන්න රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් යටතේ පිරිසෙයින් අවුරුදු 5ක් අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. (දැනට පේෂකර්ම මධ්‍යස්ථානවල සේවය කරන කාර්මික/කාර්මිකාවන් සඳහා මෙය අදාළ නොවේ.)
2.4 තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ සියළුම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අයදුම්පත් කැඳවන 2019.05.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

3. වයස් සීමාව :

| *ධාරාව* | *වයස් සීමාව* |
|---|---|
| විවෘත | 2019.05.31 දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවු. 30 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර බඳවා ගැනීම් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| සීමිත | 2019.05.31 දිනට අවු. 18 ට නොඅඩු විය යුතුය. |

4. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

| *ධාරාව* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| විවෘත බඳවා ගැනීම් | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (6) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්වීම, *සහ* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | රජයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන එක් අවුරුදු හෝ ඊට වඩා වැඩි කාල සීමාවකට අදළ පුහුණු සහතිකයක් ලබා තිබීම. |
| සීමිත බඳවා ගැනීම | භාෂාව සහ ගණිතය ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (6) සමත්වී තිබීම. | රජයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන එක් අවුරුදු හෝ ඊට වඩා වැඩි කාල සීමාවකට අදාළ පුහුණු සහතිකයක් ලබා තිබීම. |

5. *පළපුරුද්ද* - සීමිත/විවෘත බඳවා ගැනීම සඳහා -

අදාළ අධ්‍යාපන සුදුසුකම් සහිත අය, වසරක පුහුණුවකට යටත්ව බඳවා ගැනේ.

6. *කායික සුදුසුකම්* - සීමිත/විවෘත බඳවා ගැනීම සඳහා

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරන අතර පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් විවෘත අයදුම්කරුවන්ගෙන් ද පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක් සීමිත අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගැනීම සිදු කෙරේ.

7.1 *ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| පේෂකර්ම ගණිතය | අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේදී යොදා ගනු ලබන ගණිත ක්‍රමයන් පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම | 100 | පැය 1 1/2 |
| යාන්ත්‍රික ජ්‍යාමිතිය | අත්යන්ත්‍රයක උපාංග හා උපකරණ හඳුනාගැනීම හා ඒවායේ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 100 | පැය 1 1/2 |
| සාමාන්‍ය දැනීම | අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේ ඉතිහාසය නව ප්‍රවණතා අලෙවිකරණය හා කළමනාකරණය ඇතුළුව අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | 100 | පැය 1 1/2 |
| මෝස්තර නිර්මාණය | අත්යන්ත්‍ර රෙදි විවීමේදී උපයෝගී කරගනු ලබන සියලුම වියමන් ක්‍රම සහ මෝස්තර නිර්මාණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 100 | පැය 1 1/2 |

විභාගයෙන් සමත්වීම සඳහා සෑම විෂයයකින්ම 40% හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලකුණු ලබාගත යුතු වේ. විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලබා ගත යුතුය.

7.2 *වෘත්තීය පරීක්ෂණය :*

ලිඛිත විභාගයෙන් සමත් වූවන් වෘත්තීය පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබයි. වෘත්තීය පරීක්ෂණයෙන් අවම වශයෙන් 40% ක් ලකුණු ලබාගත යුතුයි.

| *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|
| 1. අත්යන්ත්‍ර රෙදි පිළි විවීම, මෝස්තර නිර්මාණය, අත් යන්ත්‍රයක් විවීම සඳහා සකස් කර ගැනීම, ඒ සඳහා යොදාගත් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම<br>2. දෙන ලද කාලයකදී යන්ත්‍රගත වෝපයක දෙන ලද මෝස්තරයක් විවීමේ හැකියාව පරීක්ෂා කිරීම | 100 | විනාඩි 30 |

8. *බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත විභාගයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් ලකුණු ලබාගත් ප්‍රමුඛතාවය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙහිදී ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

9. *තනතුරට හිමි වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි MN 1- 2016 වැටුප් පරිමාණය
රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - 45,540 ක් වේ. 2019.01.01 දිනට වැටුප රු. 24,336 කි.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය. තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි හා අනෙකුත් කරුණු තීරණය වේ.

11. *අයදුම් කිරීමේ ක්‍රමය :*

11.1 විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් මධ්‍යම පළාත් සභාව ආදායම් ශීර්ෂ 20-03-02-13 ප්‍රධාන ලේකම් (මධ්‍යම පළාත) බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

11.2 මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක (සෙ. මී. 21x29) දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 1-5 දක්වා ඡේදයන් පළමු වන පිටුවට ද අංක 6-7 තෙක් දෙවන පිටුවට ද අංක 8 සිට 10 තෙක් තුන්වන පිටුවට ද වශයෙන් ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2019.05.31** දිනට පෙර ''**ලේකම් මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය, තැ. පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''**මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්ම උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම 2019**'' යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

11.3 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම් ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

ආදර්ශ අයදුම්පත්‍රය සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා කර්මාන්ත අමාත්‍යාංශයේ, පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තු කාර්යාලයේ සහ පේෂකර්ම මධ්‍යස්ථානවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇති අතර www.moi.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.

ඩබ්. එම්. කේ. කේ. කරුණාරත්න,
ලේකම්.

මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා කර්මාන්ත අමාත්‍යාංශය,
තැ. පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය.

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්ම උපදේශක තනතුර III තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2019*

1. *(අ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :..................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. : PERERA A. B.)

*(ආ)* සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................

*(ඇ)* සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................

*(ඈ)* ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

*(ඉ)* දුරකථන අංකය : රාජකාරී :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

පෞද්ගලික :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2. *(අ)* ස්ථිර ලිපිනය (සිංහලෙන්) :..................................................

..................................................

*(ආ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

මහනුවර : ☐ මාතලේ : ☐ නුවරඑළිය : ☐

*(ඇ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2019.05.31 දිනට මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය :

අවු. : ☐ මාස : ☐ දින : ☐

3. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

4. විභාගයට පෙනී සිටින මාධ්‍ය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

5. උපන් දිනය :

වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.05.31 දිනට වයස : අවු. :................ මාස :............... දින :.............

6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 වන ඡේදය අනුව)

*(අ.පො.ස. (සා. පෙළ) විභාගය :*

වර්ෂය :................................ විභාග අංකය :................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | .................................................................. | .................................................................. |
| 2. | .................................................................. | .................................................................. |
| 3. | .................................................................. | .................................................................. |
| 4. | .................................................................. | .................................................................. |
| 5. | .................................................................. | .................................................................. |
| 6. | .................................................................. | .................................................................. |
| 7. | .................................................................. | .................................................................. |
| 8. | .................................................................. | .................................................................. |

*අ.පො.ස. (උ. පෙළ) විභාගය :*

වර්ෂය :................................ විභාග අංකය :................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | .................................................................. | .................................................................. |
| 2. | .................................................................. | .................................................................. |
| 3. | .................................................................. | .................................................................. |
| 4. | .................................................................. | .................................................................. |
| 5. | .................................................................. | .................................................................. |

6.2 වෘත්තීය සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 වන ඡේදය අනුව)

6.2.1 පුහුණු පාඨමාලාවේ නම :.............................................................................................................

පුහුණු පාඨමාලාවේ කාලසීමාව .............................. සිට ................................ දක්වා

ආයතනය :............................................................... සහතිකය වලංගු වන දිනය :.......................................................

6.2.2 *පළපුරුද්ද පිළිබඳ විස්තර :*

ආයතනය :...................................................................................................................................

කාලසීමාව .............................. සිට ................................ දක්වා

7. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය :..............................................................................
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :...................................................................................................
විභාග ගාස්තු ගෙවන ලද දිනය :...............................................................................................

| ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න. |
|---|

8. ...................................................................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මධ්‍යම පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

9. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ........................................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය.......................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :.................................................................................................................
අත්සන :.........................................................................................................................................
තනතුර හා නිල නාමය :....................................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙක්/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ යුද හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 4,52,916 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය/සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

10. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :
(අනවශ්‍ය වචන කපා හරින්න.)

........................................................................................... මයා/මිය/මෙනවියට දැනට අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................................................ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක

බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා හෝ සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්යය වශයෙන් විශ්‍රාම ගන්වා හෝ ඇති/නැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

..................................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :.................................

05-305/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.